දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය -2 කොටස - 2018
---------------------------------------------------------------

දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ - 2 කොටස 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය
-----------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මේ වන විට ක්‍රියාත්මක වන දක්ෂිණ අධිවේගී මාර්ගය (කොළඹ සිට මාතර දක්වා) මාතර සිට හම්බන්තොට දක්වා දීර්ඝ කරමින් යෝජිත හම්බන්තොට ජාත්‍යන්තර සංවර්ධන මධ්‍යස්ථාන ව්‍යාපෘතිය, වාණිජ අගනගරය, හම්බන්තොට ජාත්‍යන්තර වරාය සහ ජාත්‍යන්තර ගුවන්තොටුපල (මත්තල) අතර සම්බන්ධයක් ඇති කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. ණය ගිවිසුමට ප්‍රකාරව, ව්‍යාපෘතියේ 02 වන කොටස යටතේ දක්ෂිණ අධිවේගී මාර්ගය බෙලිඅත්ත සිට වැටිය දක්වා කිලෝමීටර් 26 ක් දීර්ඝ කිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 60,601.60 ක් වූ අතර, එයින් සියට 85 ක් වූ එ.ජ.ඩො. මිලියන 360.29 කට සමාන වූ රු. මිලියන 46,920 ක් සිවිල් හා උපදේශන කටයුතු සඳහා චීන අපනයන ආනයන බැංකුව විසින් ලබා දීමට එකඟ වී තිබුණි. එ.ජ.ඩො. මිලියන 63.58 ක් වූ ඉතිරි සියයට 15 ක ප්‍රමාණය ශ්‍රී ලංකා හැටන් නැෂනල් බැංකුව විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ -02 කොටස යටතේ වූ කටයුතු 2016 ඔක්තෝබර් 28 දින ආරම්භ කර තිබුණු අතර 2019 ඔක්තෝබර් 27 දින වන විට අවසන් කිරීමට නියමිතය.

**1.3** තත්ත්වාගණනය කළ මතය
------------------------------

මාගේ වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම
-----------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ඊට සම්බන්ධ පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ඉඩම් අත්පත් කර ගැනීමේදී වන්දි ගෙවීමේ ප්‍රමාදය වෙනුවෙන් ගෙවිය යුතු පොලිය සඳහා ප්‍රතිපාදන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 08 ප්‍රකාරව සිදු කර නොතිබුණි. | වත්කම් සහ වගකීම් අවතක්සේරු වීම. | එය ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී.ලං.රා.අ.ගි.ප්‍ර. - 08 ප්‍රකාරව සිදුකරණු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ට අනුකූලව ප්‍රතිපාදන සම්පාදනය කළ යුතුය. |

**2.2** රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම්

| අංකය | රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2017 ජූනි 27 දිනැති ත්‍රෛපාර්ශ්වික අවබෝධතා ගිවිසුම | ත්‍රෛපාර්ශ්වික අවබෝධතා ගිවිසුම යටතේ මාර්ග තුනක ඉදිකිරීම් කටයුතු සාමාන්‍ය ජනතාවට බාධාවක් නොවන පරිදි සිදු නොවන බව 2019 දෙසැම්බර් 23 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය. | ප.මා.සං.අ., මා.සං.අ. සහ කොන්ත්‍රාත්කරු විසින් අත්සන් කරන ලද ත්‍රෛපාර්ශ්වික ගිවිසුමේ විෂය පථයට අයත් මාර්ග හයෙන් මාර්ග තුනක් ප.මා.සං.අ වෙත පවරා ඇත. දැනට සිදුකෙරෙමින් පවතින ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් වූ පසු ඉතිරි මාර්ග තුන ලබාදීමට නියමිතය. | මහජනතාවට සිදුවන බාධා වළක්වා ගැනීම සඳහා එකඟ වූ කොන්දේසි වලට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසිවල 4.2 උප වගන්තිය | කාර්ය සාධන ඇපකර කොන්ත්‍රාත්කරුවන් විසින් ඔවුන්ගේ වියදමින් සැපයිය යුතු වුවද, කාර්ය සාධන ඇපකරවල පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා 2019 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුවන්ට රු. මිලියන 307 ක මුදලක් ගෙවා තිබුණි. | කාර්ය සාධන ඇපකරය ඔහුගේ වියදමින් ලබා දිය යුතුය යනුවෙන් කොන්ත්‍රාත් කොන්දේසියේ සඳහන් වීමෙන් අදහස් වන්නේ කාර්ය සාධන ඇපකරය ඉදිරිපත් කිරීම පාර්ශවයන් අතර ගිවිසුමකට එළඹීමට පූර්ව අවශ්‍යතාවයක් බව වන අතර ඉන් පසුව කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත් ප්‍රමාණ පත්‍රවල ඉඩහල ගෙවීම් අයිතම 107(2) යටතේ කාර්ය සාධන ඇපකර පිරිවැය ලැබීමට හිමිකම් ඇත. | ලංසු ලේඛන නිකුත් කිරීමට පෙර ප්‍රසම්පාදන විශේෂඥයා සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රමාණ පත්‍ර සමාලෝචනය සිදු කළ යුතුය. |

**3.** භෞතික කාර්ය සාධනය

**3.1** ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| අංකය | සංරචකය | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | අගතියට පත් ජනතාව නැවත පදිංචි කිරීම. | අධිවේගී මාර්ගය ඉදිකිරීම හේතුවෙන් ඉඩම් අහිමි වූ ජනතාව අතර බෙදා හැරීම සඳහා ව්‍යාපෘතිය විසින් රු. මිලියන 18 කට හෙක්ටයාර් 2.0526 ක (අ.5.රූ.11.ප.43) ප්‍රමාණයෙන් යුත් ඉඩමක් මිලදී ගෙන තිබුණි. කෙසේ වෙතත්, 2018 | අගතියට පත් ජනතාව තවදුරටත් පීඩාවට පත් වී වියාකූල තත්ත්වයන් ඇති කරනු ඇත. | ප්‍රයෝජනයට නොගත් පර්චස් 9 ක බිම් කොටස ගැටලුව විසඳන තුරු ව්‍යාපෘතිය යටතේ තබාගෙන ඇත. විපතට පත් කිසියම් පවුලක් විසින් එම ඉඩම ඉල්ලා නොසිටින්නේ නම් | නැවත පදිංචි කිරීමේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | දෙසැම්බර් 31 දිනට පර්චස් 9 ක එක් බිම් කොටසක් ඉතිරිව තිබුණි. | | එය ප්‍රජා පරිහරණය සඳහා අදාළ ප්‍රාදේශීය සභාවට භාර දෙනු ඇත. | |
| (ආ) | සිවිල් ඉදිකිරීම් කටයුතු සැලසුම් කිරීම | අධිවේගී මාර්ගයේ 3 සහ 4 කොටස් 2019 නොවැම්බර් 7 දින මහජනතාව සඳහා විවෘත කළද, මෙම කොටසේ ඉදිකිරීම් කටයුතුවල දුර්වල ප්‍රගතිය හේතුවෙන් සමස්ත අධිවේගී මාර්ගයම භාවිත කිරීමේ වාසිය සාමාන්‍ය ජනතාවට අහිමි විය. | ව්‍යාපෘතියේ ආරම්භක අදියරේ ඇති දුර්වල සැලසුම් හේතුවෙන් සාමාන්‍ය ජනතාවට අධිවේගී මාර්ගය සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගැනීමට තවත් මාස 6 ක පමණ කාලයක් බලා සිටීමට සිදු වීම. | ශ්‍රී ලංකා රජය සහ චීන EXIM බැංකුව අතර ණය ගිවිසුම අත්සන් කිරීම ප්‍රමාද වීම ද.අ. මා.දි. ව්‍යාපෘතිය -2 කොටස ආරම්භ කිරීම ප්‍රමාද කිරීමට හේතු වී තිබුණි. | ඉදිරි සැලසුම්වලදී සියලු අංශ සලකා බලා හොඳම ප්‍රතිලාභය මහජනතාවට ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ඉලක්ක වලට සාපේක්ෂව තත්‍ය ප්‍රගතිය | ව්‍යාපෘතිය මාස හතරක ප්‍රමාදයකින් ආරම්භ කර තිබුණි. 2019 නොවැම්බර් 30 වන විට ව්‍යාපෘතියේ අපේක්ෂිත භෞතික ප්‍රගතිය සහ මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 88.24 ක් සහ සියයට 66.21 ක් වූ අතර ව්‍යාපෘතියේ තත්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 86.75 ක් සහ සියයට 60.84 ක් විය. | ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කිරීම ප්‍රමාද වීම සහ පිරිවැය වැඩි වීමට ඇති හැකියාව. | 2020 අප්‍රේල් 11 දින දක්වා කාලය දීර්ඝ කර ඇත. වැඩසටහනට අනුව, කොන්ත්‍රාත්කරුගේ තත්‍ය ප්‍රගතිය සැලසුම් කළ වැඩවලට වඩා තරමක් පසුගාමීව පවතී. | ඉතිරි වැඩකටයුතු වේගවත් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| අංකය | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශක්‍යතා වාර්තාවේ 8.33 පරිච්ඡේදයේ සේවා ප්‍රදේශ ඇති ස්ථාන සඳහන් කර ඇතත්, එය ප්‍රමාණ පත්‍රවල සඳහන් කර නොතිබුණු අතර, දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව සඳහා සේවා ප්‍රදේශ ඉදිකිරීමට කිසිදු සැලසුමක් නොතිබුණි. තවද, කොට්ටාව සිට මාතර දක්වා වූ දක්ෂිණ අධිවේගී මාර්ගය භාවිත කරන්නන් සඳහා | වැලිපැන්න සිට හම්බන්තොට දක්වා කි.මී. 176 ක දුරක් ගමන් කරන මගීන්ට සේවා සැපයීම ගැටලු සහගත තත්ත්වයකට පත්වීම. | සේවා ප්‍රදේශයක් ඉදිකිරීම සඳහා ද.අ.මා. දිගුව කොන්ත්‍රාත්තු වල ප්‍රමාණ පත්‍රවල ප්‍රතිපාදන නොමැති අතර මෙය අමාත්‍ය මණ්ඩලයේ සහ චීන එක්සිම් බැංකුවේ එකඟතාවය ලබා ගැනීමෙන් පසු | දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය සඳහා සේවා ප්‍රදේශ ඉදිකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන පිළියෙල කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | කි.මී. 46 ස්ථානයෙන් පසුව සේවා ප්‍රදේශ කිසිවක් නොතිබුණි. | | කොන්ත්‍රාත් ඉතුරුම් ප්‍රයෝජනයට ගනිමින් කොන්ත්‍රාත් අමතර වැඩ යටතේ සිදු කළ යුතුය. | |
| (ආ) | කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසිවල 4.2 උප වගන්තියට අනුව, කාර්යයන් ක්‍රියාත්මක කර අවසන් කරන තෙක් සහ යම් දෝෂයක් නිරාකරණය කරන තෙක් කාර්ය සාධන ඇපකරය වලංගු සහ බලාත්මක කළ හැකි බව කොන්ත්‍රාත්කරු විසින් සහතික කළ යුතුය. ලබා දී ඇති කාලය දීර්ඝ කිරීම මත පදනම්ව, ව්‍යාපෘතියේ දෝෂ වගකීම් කාලය 2021 අප්‍රේල් 11 දිනෙන් අවසන් වනු ඇත. කෙසේ වෙතත්, පවතින කාර්ය සාධන ඇපකරය ආවරණය කර තිබුණේ 2020 ජුනි 26 දින දක්වා වූ කාලය සඳහා පමණි. | දෝෂ සඳහා වගකීම් කාලය තුළ කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුවේ කිසියම් කොන්දේසි කඩකිරීමක් මත පාඩු සිදුවීමේ හැකියාව. | කාර්ය සාධන ඇපකරය එහි කල් ඉකුත්වන දිනය වූ 2020 ජුනි 26 දිනට පෙර දෝෂ වගකීම් කාල සීමාව අවසාන්වන තුරු (2021.02.24 දක්වා) දීර්ඝ කිරීමට උපදෙස් නිකුත් කරනු ලැබේ. | කාර්ය සාධන ඇපකරයේ කාලය දීර්ඝ කිරීමට වහාම පියවර ගත යුතුය. |
| (ඇ) | කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසියේ 14.7 (ආ) උප වගන්තිය අනුව අතුරු ගෙවීම් සහතික අංක 37 දක්වා ප්‍රමාද ගෙවීම සඳහා පොලී වශයෙන් රු. මිලියන 18.6 ක් ගෙවා තිබුණි. | වැළැක්විය හැකි ව්‍යාපෘතියේ සමස්ථ පිරිවැය වැඩි වීම. | 2018 වසර සඳහා අයවැය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අතුරු ගෙවීම් සහතික 21, 22, 23 සහ 24 සඳහා ගෙවීම් ප්‍රමාද විය. ඉහත අතුරු ගෙවීම් සහතික ගෙවීම සඳහා නියමිත දිනට පසුව අමතර ප්‍රතිපාදන ලැබී ඇත. | පොලී වියදම් වළක්වා ගැනීම සඳහා නියමිත පරිදි ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | තාක්ෂණික පිරිවිතරවලට අනුව, එම ප්‍රමාණ පත්‍ර අයිතම දෙක යටතේ මිලදී ගන්නා සියලුම උපකරණ සහ පරිභෝජන ද්‍රව්‍ය, කොන්ත්‍රාත්තුව අවසානයේ සේවායෝජකයාට හොඳ තත්ත්වයේ ආපසු ලබා දිය යුතුය. කෙසේ වෙතත්, මිලදී ගත් සියලුම වත්කම් ලේඛනයේ සටහන් කර තිබේද යන්න තහවුරු කර ගැනීම සඳහා ව්‍යාපෘතිය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙනගොස් නොතිබුණි. | සියලුම වත්කම් සේවා යෝජකයා වෙත පැවරෙන්නේද යන්න සහතික කර ගැනීමට නොහැකි වීම සහ ස්ථාවර වත්කම් පිළිබඳ තොරතුරු නොමැතිවීම වත්කම් අවභාවිතා කිරීමට හේතු විය හැක. | විගණනය කරන අවස්ථාව වන විට ස්ථාවර වත්කම් ලේඛනය නිසි ලෙස යාවත්කාලීන කර නොතිබුණි. ඉල්ලා සිටින තොරතුරු සමඟ ස්ථාවර වත්කම් ලේඛනය වහාම යාවත්කාලීන කරනු ලැබේ. | ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නිසි ලෙස යාවත්කාලීන කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | මාර්ගයට අයත් සීමාවෙන් (ROW) ලබා ගන්නා ද්‍රව්‍ය සඳහා කිසිදු ගාස්තුවක් ගෙවීම අවශ්‍ය නොවන බවට තාක්ෂණික පිරිවිතරයේ 03 වෙළුමේ 01 වගන්තියේ සීඑල්.207.12 හි නිශ්චිතව සඳහන් කර තිබුණද, මාර්ගයට අයත් සීමාවෙන් කරන ලද පාෂාණ කැණීම් සඳහා පුරස්කාර ගෙවීම් ලෙස රු.මිලියන 10 ක් ගෙවා තිබුණි. | එකඟ වූ කොන්දේසිවලට පටහැනිව සිදු කරන ලද ගෙවීම් හේතුවෙන් ව්‍යාපෘතියේ සමස්ථ පිරිවැය වැඩි වීම. | මෙමගින් අදහස් වන්නේ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මාර්ගයට අයත් සීමාවෙන් ලබාගත් ද්‍රව්‍ය සඳහා අයකිරීම් සිදු නොකරන බවයි. 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත යටතේ, මාර්ගයට අයත් සීමාව ඇතුලත පාෂාණ කැණීම සඳහා කැණීම් බලපත්‍රයක් නිකුත් කිරීමට භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය (GSMB) විසින් පුරස්කාර මුදල් අය කරනු ලැබේ. | කොන්ත්‍රාත් කොන්දේසි වලට අනුකූලව ගෙවීම් කළ යුතුය. |
| (ඊ) | 2019 අගෝස්තු මාසයේ අතුරු ගෙවීම් සහතික අංක 37 දක්වා පමණක් අනුමත ප්‍රමාණ පත්‍ර ඉක්මවා රු. මිලියන 7,454 ක් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. එම අයිතම අතරින් අයිතම 32 ක සියයට 100 කට වඩා වැඩි විචලනයන් පෙන්විණි. තවද, ප්‍රමාණ පත්‍ර සංශෝධිත කිරීමට පවා ව්‍යාපෘතිය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ව්‍යාපෘතියේ සමස්ථ පිරිවැය වැඩි වීමට ඇති හැකියාව සහ මුදල් අවභාවිතා කිරීමට ඇති හැකියාව. | කොන්ත්‍රාත්කරුගේ අරමුදල් ලබාගැනීම සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට ප්‍රාථමික සංකල්පමය නිර්මිත වලින් අනායාචිත යෝජනා (Unsolicited Proposal) කොන්ත්‍රාත් ප්‍රමාණ පත්‍ර සකස් කර ඇත. කොන්ත්‍රාත් විෂය පථයෙන් ප්‍රමාණ පත්‍රවල සඳහන් ප්‍රමාණවල අපගමණයන් කොන්ත්‍රාත්කරු විසින් සවිස්තරාත්මක සැලසුම් අදියරේදී සොයාගෙන ඇත. | ප්‍රමාණ පත්‍ර ප්‍රතිශෝධනය කිරීමට ක්‍රියා කළ යුතු අතර අනාගතයේදී ඇස්තමේන්තු නිවැරදිව සකස් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | ව්‍යාපෘතිය **2019** නොවැම්බර් වන විට භෞතික කාර්යයන් සියයට **86.75** ක් සම්පූර්ණ කර තිබුණද, **2019** දෙසැම්බර් **17** සහ **20** යන දිනවල තංගල්ල - වීරකැටිය මාර්ගයේ නව අන්තර් හුවමාරුවක් සහ සම්මත මංතීරු දෙකේ අතිරේඛ සම්බන්ධිත හෝ අධිවේගී මාර්ගයට සම්බන්ධිත මාර්ග **8** ක් සඳහා කළමනාකාරිත්වය විස්තරාත්මක සැලසුමක් සහ පිරිවැය ඇස්තමේන්තුවක් කැඳවා තිබුණි. ව්‍යාපෘතිය අවසන් වීමට ආසන්න වන විට සැලසුම් කරන ලද දැවැන්ත ඉදිකිරීම් කටයුතුවල විෂය පථය වෙනස් කිරීම විගණනයට ප්‍රශ්නගත වනු ඇත. | ඉඩම් අත්පත් කර ගැනීම සහ අනෙකුත් මූලික කටයුතු සඳහා අමතර පිරිවැයක් දැරීම සිදුවීමට ඇති හැකියාව. | තංගල්ල-වීරකැටිය මාර්ගය සඳහා නව අන්තර් හුවමාරුව කොන්ත්‍රාත්තුවේ මුල් විෂය පථයේ නොතිබුණි. තංගල්ල ප්‍රදේශයේ සංචාරක ව්‍යාපාරය සහ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා අධිවේගී මාර්ගයට සම්බන්ධතාව වැඩි කිරීමට රජය තීරණය කර ඇත. ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රයෝජනය සඳහා කොන්ත්‍රාත් ඉතුරුම් යොදා ගනිමින් බැදිගම නව අන්තර් හුවමාරුවක් ඉදිකරනු ලැබේ. | ව්‍යාපෘතිවල මූලික අදියරේදී වැඩ විෂය පථය පැහැදිලිව හඳුනාගත යුතුය. |

**3.3** වැඩබිම් පරීක්ෂාවේදී සිදුකරන ලද නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| විගණන පරීක්ෂණ දිනය වූ **2019** දෙසැම්බර් **23** දින වන තෙක් අනුකූල නොවන වාර්තා දෙකක් **(NCR)** නිවැරදි කර නොතිබුණි. විස්තර පහත පරිදි වේ.<br>නිකුත් කළ දිනය — විස්තරය<br>**2018** ජනවාරි **15** — දහඅමුණ නැවත පදිංචි කිරීමේ<br>**2019** අගෝස්තු **10** — ඉඩමේ අභ්‍යන්තර මාර්ගයේ තාර මතුපිට ඉරිතැලීම් සිදුව තිබුණි. | පිළිසකර කිරීමේ කටයුතු ප්‍රමාද වීමෙන් මාර්ගයේ තත්ත්වයට තවදුරටත් හානි විය හැකිය. | කොන්ත්‍රාත්කරු මේ දක්වා පිළිසකර කිරීමේ කටයුතු සිදු කර නොතිබුණි. ඒ අනුව, අනුකූල නොවන වාර්තා දෙක සඳහා ගෙවීම් අත්හිටුවා ඇත. අසාර්ථක වීමට හේතුව ඉංජිනේරුවරයා විසින් විමර්ශනය කරන අතර නිවැරදි කිරීමේ කටයුතු සඳහා උපදෙස් නිකුත් කරනු ලැබේ. | නිවැරදි කිරීමේ කටයුතු කඩිනමින් සිදුකිරීමට කටයුතු කළ යුතුය. |